// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2482/10 – 2026 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා – 2026.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/05.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.11.25 වැනි දින අංක 2359/61 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.22 වැනි දින දරන නියෝගයෙන්,

එල්.පී. ජයසුන්දර මයා, 14/3, ඉසුරුපුර, කැස්බෑව, පිළියන්දල.

සහ

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර පවත්නා 2023.11.13 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ආර්. නවෝදයම් මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ ආර්. නවෝදයම් මහතා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.11.22 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2026 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

EOG 04– 0001/1

1A – G 046557 – 13 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2023/05.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එල්.පී. ජයසුන්දර මයා, 14/3, ඉසුරුපුර, කැස්බෑව, පිළියන්දල.

සහ

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ.ඒ. තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2026 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/05.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එල්.පී. ජයසුන්දර මයා, 14/3, ඉසුරුපුර, කැස්බෑව, පිළියන්දල.

සහ

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) ලෙස සේවය කරන එල්.පී.ජයසුන්දර මහතාට පහත කරුණු සම්බන්ධයෙන් හිමිකමක් තිබේද, හිමිකමක් තිබේ නම්,

1. පත්වීම් දිනය පෙරදාතම නොකිරීම
2. අතිරේක සාමාන්‍යාධිකාරි තනතුරට පත් නොකිරීම
3. ප්‍රවාහන දීමනා ලබා නොදීම
4. රඳවාගැනීමේ දීමනා ලබා නොදීම
5. වෘත්තීය දීමනා ලබා නොදීම
6. සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය නොකිරීම
7. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල දීමනා ගෙවීම් නොගෙවීම

8. සන්නිවේදන දීමනා ලබා නොදීම
9. කාර්යාංශ අනුප්‍රාප්තික සමාගමේ මානව සම්පත් ප්‍රධානී ලෙස හා / හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් නොකිරීම.

මගින් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද? කවරදා සිටද? යන්නත් පිළිබඳව වේ”.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04– 0001/2

---

මගේ අංකය: IR/COM/02/2023/254.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එස්.ජේ. ගුණරත්න මහතා, අංක 403/7, ෆීල්ඩ් විව් ඇවනියු, හෝකන්දර පාර, හෝකන්දර දකුණ.

සහ

නිම්රෝඩ් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 188, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමඟ, අංක 34/64, ඒ.බී. හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2026 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/254.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්.ඒ. ගුණරත්න මහතා, අංක 403/7, ෆීල්ඩ් විව් ඇවනියු, හෝකන්දර පාර, හෝකන්දර දකුණ.

සහ

නිම්රෝඩ් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 188, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"නිම්රෝඩ් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂක ලෙස සේවය කරන ලද එස්.ඒ. ගුණරත්න යන අයට 2019 දෙසැම්බර් සිට 2020 අගෝස්තු දක්වා කාලසීමාව සඳහා දීමනා සහිත වැටුප ලෙස රු. 800000/- ක මුදලක් හිමිද එසේ හිමි වන්නේ නම් ඔහුට එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න හා එසේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04– 0002

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.